// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1705/33 - 2011 මැයි 13 වැනි සිකුරාදා - 2011.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

මගේ අංකය : 01/10/03/04.

**ඌව පළාතේ පළාත් සභාව**

පත් කිරීම්

ඌව පළාත් ගරු ආණ්ඩුකාරවර සී. නන්ද මැතිව් මැතිතුමා විසින් පහත සඳහන් පත් කිරීම් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

(1) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ, වී. පී. විමල් කරුණාතිලක මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව 2011.04.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බණ්ඩාරවෙල මහා නගර සභාවේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීමට,

(2) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I වැනි පන්තියේ වී. සී. හෙට්ටිආරච්චි මහතා, 2006.11.07 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) වශයෙන්,

(3) බදුල්ල නියෝජ්‍ය ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෛද්‍ය ජේ. සී. එම්. තෙන්නකෝන් මහත්මිය තම නිත්‍ය තනතුරට අතිරේකව, 2011.03.28 වැනි දින සිට 2011.04.10 දින දක්වා, බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

(4) ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් එච්. එම්. සෝමතිලක මහතා 2011.04.30 වැනි දින සිට 2011.05.06 දින දක්වා විදේශ ගත වන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ ආර්. ඒ. එච්. ඒ. සමරසිංහ මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් තනතුරේ වැඩ බැලීමට,

(5) ඌව පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, පරිසර සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් ජී. කේ. එස්. එල්. රාජදාස මහතා, 2011.04.30 දින සිට 2011.05.06 දින දක්වා විදේශ ගත වන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ එල්. එල්. අනිල් විජේසිරි මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, පරිසර සහ සංචාරක අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ වැඩ බැලීමට,

(6) ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමූපකාර සහ ආහාර සැපයීම් හා බෙදා හැරීම් අමාත්‍යාංශයේ ලේකම් එම්. ඒ. බී. දයා සෙනරත් මහතා 2011.04.30 දින සිට 2011.05.06 දින දක්වා විදේශ ගත වන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ජී. රත්නායක මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන, පාරිභෝගික කටයුතු හා සමූපකාර සහ ආහාර සැපයීම් හා බෙදා හැරීම් අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

(7) ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු සහ වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, 2011.04.30 වැනි දින සිට 2011.05.06 වැනි දින දක්වා විදේශ ගතවන බැවින් ඇය නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ කේ. පතිරාජ මහත්මිය, තම නිත්‍ය

තනතුරට අතිරේකව ඌව පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක කටයුතු හා වනිතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

(8) ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්), වී. සී. හෙට්ටිආරච්චි මහතා, 2011.04.30 වැනි දින සිට 2011.05.06 දින දක්වා විදේශ ගතවන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II වැනි පන්තියේ එච්. එම්. එස්. ටී. සම්පත් මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

(9) ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා), එම්. එල්. සී. ප්‍රනාන්දු මහතා 2011.04.30 වැනි දින සිට 2011.05.06 වැනි දින දක්වා විදේශ ගතවන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ I වන පන්තියේ ඒ. ඒ. පී. එස්. කේ. කරුණාරත්න මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) තනතුරේ වැඩ බැලීමට,

(10) ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය), ඩබ්. එම්. අත්තනායක මහතා, 2011.04.30 වැනි දින සිට 2011.05.06 දින දක්වා විදේශ ගතවන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II වැනි පන්තියේ, කේ. ආර්. පී. කෝදාගොඩ මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය), තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

(11) ඌව කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බලන එච්. එම්. සෝමතිලක මහතා, 2011.04.30 වැනි දින සිට 2011.05.06 දින දක්වා විදේශ ගතවන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ කේ. ඩී. සිරිසේන මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව කළමනාකරණ සංවර්ධන පුහුණු ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩ බැලීමට,

(12) බණ්ඩාරවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බලන එච්. එම්. සෝමතිලක මහතා, 2011.04.30 වැනි දින සිට 2011.05.06 දින දක්වා විදේශ ගතවන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ ජී. ඩබ්. සී. එස්. ප්‍රියභාෂිණී මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව බණ්ඩාරවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස් තනතුරේ වැඩ බැලීමට,

(13) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරී කේ. ඩී. ජයවීර මහතා නැවත සේවයේ පිහිටුවමින් ඌව පළාත් ඉඩම් කොමසාරිස් තනතුර සඳහා ලබාදී ඇති පත්වීම් හා ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා ලබාදී ඇති පත්වීම් 2011.04.30 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කිරීමට,

(14) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාමික නිලධාරී කේ. ඩී. ජයවීර මහතා, 2011.05.01 වැනි දින සිට මෙම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2011.12.31 දින හෝ යන දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සහකාර ලේකම් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට,

(15) ඌව පළාත් පළාත් පාලන කොමසාරිස් තනතුරේ වැඩ බලන එම්. පී. එන්. එම්. වික්‍රමසිංහ මහතා 2011.04.24 දින සිට 2011.05.01 දින දක්වා විදේශ ගතවන බැවින්, ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එන්. සී. හෙන්නායක මහත්මිය, තම නිත්‍ය තනතුරට අතිරේකව ඌව පළාත් පළාත් පාලන කොමසාරිස් තනතුරේ රාජකාරී ආවරණය කිරීමට,

(16) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ ගුණදාස සමරසිංහ මහතා, 2011.05.03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් ඉඩම් කොමසාරිස් වශයෙන්,

(17) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ ගුණදාස සමරසිංහ මහතා, තම නිත්‍ය තනතුරට අතිරේකව 2011.05.03 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ඌව පළාත් කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, පරිසර සහ සංචාරක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් තනතුරේ වැඩ බැලීමට.

එච්. එම්. සෝමතිලක,
ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්.

2011 මැයි මස 09 වැනි දින,
බදුල්ල, රජවීදියේ,
ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

05 - 710

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.